# <u>මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ</u>
# <u>කොළඹ ප්‍රකාශනය</u>

## <u>2008 නොවැම්බර්</u>

**<u>මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනයේ</u>** දස වැනි සංවත්සරය එළැඹ තිබෙන මේ අවස්ථාවේදී මෙහි පහත අත්සන් කරන අපිː

ප්‍රකාශනයෙහි විශේෂ කොට දැක්වෙන මූලධර්ම හා හර පද්ධති කෙරෙහිත් මාධ්‍ය නීති ප්‍රතිශෝධනය සඳහා අප ඉදිරිපත් කළ ක්‍රියාදාමය කෙරෙහිත් අපගේ කැපවීම යළි තහවුරු කරමින්, ප්‍රකාශනය සමාලෝචනය කිරීමටත් ප්‍රකාශනයෙන් අනතුරුව ඇති වුණු වර්ධනය ගෙන හැර දැක්වීමටත් මෙතෙක් සපුරාගත හැකි නොවුණු ඉලක්ක පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටත් ප්‍රකාශනයෙන් පසුව උද්ගත වී තිබෙන අභියෝග තෝරා බේරා ගැනීමටත් මේ අවස්ථාව උපයෝගී කොට ගනිමු.

මාධ්‍ය, සංවර්ධනය හා දරිද්‍රතාව පිටුදැකීම පිළිබඳ 2006 කොළඹ ප්‍රකාශනය(යුනෙස්කෝ ප්‍රකාශනය) අත්සන් තැබුණු බවත් සමාජ යුක්තිය හා සංවර්ධනය වෙනුවෙන් කැපවුණු නිදහස් බහුවිධ හා ස්වාධීන මාධ්‍යයක ප්‍රවර්ධනය වෙනුවෙන් ඒ ප්‍රකාශනය යටතේ රජයේ කැපවීම ඊට ඇතුළත් වන බවත් අපි මෙහිදී සඳහන් කරමු. පුවත්පත් නිදහස පිළිබඳ අයිතිය සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයට රුකුල් දෙන මූලික අයිතියක්යැයි 1991 වින්ඩ්හෝක් ප්‍රකාශනයෙන්ද තහවුරු වූ බවත් අපි මෙහිදී තවදුරටත් ප්‍රකාශ කරමු.

1998 ප්‍රකාශනයෙන් යෝජිත ප්‍රතිශෝධන ක්‍රියාත්මක කිරීමත් පුවත්පත් කලාවේදීන්ගේ අරක්‍ෂාව තහවුරු කරන අතරම ඔවුන්ගේ වෘත්තියෙහි යෙදීම සඳහා ඔවුනට ඇති ව්‍යවස්ථානුගත අයිතිය තහවුරු කිරීමත් නිදහස් බහුවිධ හා ස්වාධීන මාධ්‍යයක් පවත්වා ගැනීමේ මඟක් බව අපි විශ්වාස කරමු.

ඒ අරමුණ ඉටුකර ගැනීම පිණිස, 1998 ප්‍රකාශනයේ ප්‍රතිශෝධිත පිටපතක් ඉදිරිපත් කිරීමට අප මේ අවස්ථාව උපයෝගී කර ගන්නා අතරම, කොළඹ ප්‍රකාශනයේ න්‍යායාත්මක අභිලාෂ සජීවී යථාර්ථයක් බවට පරිවර්තනය කර ගැනීම සඳහා කටයුතු කිරීමටද අපි ප්‍රතිඥා දෙමු.

**<u>පූර්විකාව</u>**

ප්‍රකාශනයේ නිදහස හා තොරතුරු ලබා ගැනීමේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක වැදගත් අංගයක් බවත් එහි ප්‍රගතිය හා සුබසාධනය සඳහා මෙන්ම අනෙක් මානව අයිතිවාසිකම් හා මූලික නිදහස බුක්ති විඳීම සඳහාද එය අත්‍යවශ්‍ය බවත් ඒත්තු ගනිමින්, සිය රජයේ කටයුතු නිරීක්ෂණය කිරීමට මහාජනතාවට හැකි වීමට නම්, දේශපාලන දැනුම්වත් භාවය ඔවුනට ලබා දීමට හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පූර්ණ හවුල්කරුවන් වීමේ ඉඩකඩ ඔවුනට සලසාදීමට නම්, තොරතුරු ලබා ගැනීමේ මං ඔවුන් වෙනුවෙන් විවෘත වීම අත්‍යවශ්‍ය බව සිත්හි ධාරණය කරගනිමින්ඃ

ගැටුම් සහිත වකවානුවක, විවිධ මත ප්‍රවර්ධනය මඟින් ගැටුම් සමනය කරනු පිණිස නිදහස් හා ස්වාධීන මාධ්‍යයක පැවැත්ම අත්‍යවශ්‍ය බව ඒත්තු ගනිමින් :

ඉහත සඳහන් අවශ්‍යතාව සපුරාලීමෙහිලා පුවත්පත් කලාවේදියා තීරණාත්මක මෙහෙවරක් ඉටු කරන බව අවබෝධ කර ගනිමින් :

රාජ්‍ය නිලධරයන් ඔවුන්ගේ නිල ස්වභාවය අනුවම වඩාත් දැඩි මට්ටමේ විවේචන සාමාන්‍ය පුද්ගලයනට වඩා ඉවසා සිටිය යුතුයැයි සැලකිල්ලට ගනිමින්ඃ

පොදුජන ප්‍රශ්න පිළිබඳ විවාද නිර්බාධක හා ප්‍රබල විය යුතු බවත් නිදහස් විවාදයකදී ඇතැම් සාවද්‍ය ප්‍රකාශද නොවැළැක්විය හැකි බවත් ඒත්තු ගොස් තිබෙන අතරම නිලධාරි චර්යාව විවේචනය කරන්නන්ට නෛතික ආරක්ෂාව අවශ්‍ය බවද විශ්වාස කරමු.

ඒ මඟින් පොදුජන ප්‍රශ්න පිළිබඳ විවාදයේ ශක්තිය හීන වී එහි පරාසය සීමාවෙමින් වාරණය බොහෝවිට ක්‍රියාත්මක කැරෙන්නේ අත්තනෝමතික ලෙස හා සාවද්‍ය ලෙස බවත් තොරතුරු දැන ගැනීමට ඇති පොදු ජනතා අයිතිය උල්ලංඝනය වන අන්දමින් හා ප්‍රකාශනයේ නිදහස පිළිබඳ ජාත්‍යන්තර ප්‍රතිමිතිද උල්ලංඝනය වන අන්දමින් බවත් ඒත්තු ගනිමින්ඃ

ජනමාධ්‍යකරුවනට හා දේපලවලට ප්‍රහාර එල්ලවීමත් ඔවුන් බිය වැද්දීම හා ඔවුනට තර්ජනය කිරීමත් පිළිබඳ සිද්ධිද පුවත්පත් නිදහසට හා ප්‍රකාශනයේ නිදහසට අහිතකර සේ බලපාන ඒ ප්‍රහාර, බියවැද්දීම් හා තර්ජන පිළිබඳ පරීක්ෂණ සිදු නොවීමත් තරයේ සැලකිල්ලට ගනිමින්,

නිරන්තර බියජනක තත්ත්වය යටතේ පුවත්පතටත් මාධ්‍යයටත් නිදහසේ ක්‍රියාත්මක විය නොහැකි බව අවබෝධ කර ගනිමින්ඃ

ජාතික ආරක්ෂාවට මුවා වී ප්‍රකාශන නිදහසත් තොරතුරු ලබා ගැනීමේ නිදහසත් මත අයුක්ති සහගත තහංචි පැනැවීමට රජය ගන්නා පියවර අධෛර්ය කළ හැකි වන සේ ඒ දෙයාකාර නිදහස මත ජාතික ආරක්ෂාවේ නාමයෙන් තහංචි පැනවිය හැකි සීමා සහිත පරාසය පිළිබඳ අවබෝධයක් ප්‍රවර්ධනය කිරීමේ අභිප්‍රායයෙන්,

නිදහස් හා ස්වාධීන පුවත්පතේ හා මාධ්‍යයේ ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගිකත්වයේ උසස් ප්‍රමිති සාක්ෂාත් කර ගැනීම කෙරෙහි යොමුවන ඒකාබද්ධ වගකීමත් සජීවී එක්සත් භාවයේ ප්‍රවර්ධනය හා මාධ්‍යකරුවනුත් ප්‍රායෝගිකත්වය පිළිබඳ ආචාර විද්‍යාත්මක ප්‍රතිමාන කෙරෙහි බැඳීමත් අතර අභේද්‍යනීය සහයෝගය අවශ්‍ය බවද පිළිගනිමින්:

පහත සඳහන් යෝජනාවලට එකඟ වන අතරම, ස්වකීය පුළුල් ව්‍යාප්තියත් වගකීම හා ක්‍රියාකාරිත්වයත් පිළිබඳ ප්‍රවර්ධනය සඳහා අදාළ මණ්ඩල පියවර ගත යුතුයැයිද නිර්දේශ කරමු.

<u>1998 කොළඹ ප්‍රකාශනයෙන් පසු උදා වූ වර්ධනය</u>

ගත වූ දශකයේදී මතු දැක්වෙන ධනාත්මක වර්ධන ඇතිවුණු බව ඒ පිළිබඳ අගැයීමෙන් යුතුව සඳහන් කරමු:

(අ) දණ්ඩ නීති සංග්‍රහයේ "සාපරාධී අපහාසය" පිළිබඳ විධිවිධාන හා 2002 පුවත්පත් මණ්ඩල නීතිය අහෝසි කිරීම, අපවාදාත්මක වචන හෝ සංකේත මඟින් ජනාධිපතිවරයා අපහාසයට ලක් කරනු පිණිස දරන ලද ප්‍රයත්නවලට දඬුවම් පැමිණැවුණු , දණ්ඩ නීති සංග්‍රහයේ 118 වැනි වගන්තිය ඉවත් කිරීම සහ බරපතළ අන්දමින් පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට බලය පැවැරූ (1953) පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද පනතේ 1978 සංශෝධනය ඉවත් කිරීම.

(ආ) ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, පුවත්පත් පැමිණිලි කොමිසම හා ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලය ආරම්භ කිරීම.

ඒ ධනාත්මක වර්ධනයට අමතරව, 1998 අනුමත වුණු යෝජනා ක්‍රියාත්මක කරනු පිණිස කරන ලද දේ අල්ප බව අපි සන්තාපයෙන් යුතුව සටහන් කරමු. "මාධ්‍ය නීති ප්‍රතිශෝධනය අරමුණු කොට ගෙන " මාධ්‍ය නීති ප්‍රතිශෝධන අග්‍රාමාත්‍ය කමිටුවක්" පිහිටුවීම "තොරතුරු ලබාගැනීමේ නිදහස පිළිබඳ පනත" ඇමැති මණ්ඩලයෙන් අනුමත වීම, අධිකරණ අපහාසය පිළිබඳ පනතක් කෙටුම්පත් කරනු

පිණිස සර්ව පාක්ෂික පාර්ලිමේන්තු කමිටුවක් පත් කිරීම, යනාදී මූලික පියවර කීපයක් ගන්නා ලද නමුත් එකකට පසුව එකක් වශයෙන් බලයට පත් හැම රජයක්ම . කතා කිරීමේ පුළුල් නිදහසක් හා පුළුල් මාධ්‍ය නිදහසක් ජනතාවට දීම හැම රජයකම මැතිවරණ පොරොන්දුවක් වශයෙන් තිබියදීත් . මෙකී ප්‍රතිශෝධන නොසලා හැරීම අභාග්‍යයකි.

තොරතුරු ලබා ගැනීමේ අයිතියට අදාළ අධිකරණ ක්‍රියාවලියෙහි යම් ප්‍රගමනයක් දක්නට ලැබී ඇතත් කතා කිරීමේ හා ප්‍රකාශනයේ නිදහස පිළිබඳ පරාසය සම්බන්ධ අධිකරණ අර්ථ නිරූපණ මඟින් ඇතැම් මූලික අයිතිවාසිකම් වෙනුවට සිදු විය යුතුව තිබුණු ව්‍යාප්තිය ව්‍යවස්ථාදායකයේ උදාසීනත්වයත් විධායකයේ සීමාන්ත ක්‍රියාත් නිසා ආහෝසි වී ඇත්තේය.

එහෙයින් අපි මතු දැක්වෙන ප්‍රතිශෝධන සඳහා අපගේ ඉල්ලීම් යළි යළිත් ඉදිරිපත් කරමු:

## 1. ව්‍යවස්ථානුගත විධිවිධාන

### 1.1 ප්‍රකාශන නිදහස පිළිබඳ ව්‍යවස්ථානුගත සහතික

1.1.1 කිසියම් තැනැත්තකුට හෝ තැනැත්තියකට ශ්‍රී ලංකා ජනරජය තුළ ඇගේම හෝ අන් අයත් සමග එක්ව හෝ ඕනෑම නීත්‍යනුකුල රැකියාවක වෘත්තියක වෙළෙදාමක ව්‍යාපාරයක හෝ ව්‍යවසායකයක යෙදීමේත් වෘත්තියෙහි ප්‍රායෝගිකව නියැළිමේත් අයිතිය සහතික කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (ජී) වගන්තියෙන් සැපැයෙන ආරක්ෂාව ඇතිව තමන්ගේ වෘත්තියෙහි යෙදීමට මාධ්‍යවේදියාට නිදහස තිබිය යුතුය.

1.1.2 ශ්‍රී ලංකාවේ ප්‍රකාශන නිදහස පිළිබඳ ව්‍යවස්ථානුගත සහතිකය රටේ ජාත්‍යන්තර නෛතික බැඳීම්වලට විශේෂයෙන්ම 1980 දී ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලද “සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියට” සමාන්තර වීම අවශ්‍යය.

1.1.3 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියට වඩාත් සමීප වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රකාශන නිදහස, මත පළ කිරීමේ නිදහස හා තොරතුරු ලබා ගැනීමේ නිදහස පැහැදිලි කරන වචනවල වඩා හොඳ සංයෝජනයක් අවශ්‍යය.

එම ප්‍රඥප්තියේ 19 වැනි වගන්තියෙහි මෙසේ ප්‍රකාශිතය:

1. නිර්බාධකව සිය මත දැරීමේ අයිතිය සෑම කෙනකුටම තිබිය යුත්තේය.

2. ප්‍රකාශනයේ නිදහස පිළිබඳ අයිතිය සෑම කෙනකුටම තිබිය යුත්තේය. තොරතුරු හා සියලු ආකාරයේ අදහස් සොයා බැලීමේ ලබා ගැනීමේ හා කටවචනයෙන් ලේඛනයෙන් මුද්‍රණයෙන් කලා ස්වරූපයෙන් හෝ ඔහු රිසි අනෙක් කවරම මාධ්‍යයකින් හෝ දේශ සීමා භේදයකින් තොරව බෙදා හැරීමේ අයිතියද ඊට ඇතුළත් විය යුතුය.

**1.2 මූලික අයිතිවාසිකම් කෙරෙහි බලපාන ව්‍යස්ථානුගත තහංචි**

ප්‍රකාශන නිදහස කෙරෙහි ඒ සා පහසුවෙන් තහංචි පනවන්නට විධායකයට අවසර ලැබෙතොත් ප්‍රකාශන නිදහසට ඉඩ දෙන පුළුල් නිදහස් ව්‍යවස්ථානුගත විධිවිධානයක් නිෂ්ඵල වන හෙයින් අපි මෙසේ යෝජනා කරමු:

(1) භාෂණය, ප්‍රකාශනය හා තොරතුරු පිළිබඳ නිදහස හා සම්බන්ධ සුවිශේෂ අයිතිය මත පැනැවෙන තහංචි  සාධාරණ විය යුතුය. යුක්ති සහගත විය යුතුය.(අ) අයිතියේ ස්වභාවය, (ආ) සීමා පැනවීමේ වැදගත්කම හා අරමුණ, (ඉ) සීමාවේ ස්වභාවය හා ප්‍රමාණය (ඊ) සීමාව හා එහි අරමුණ අතර කාල පරාසය සහ (උ) අරමුණ ඉටු කර ගැනිම සඳහා බාධක අඩුවෙන් යොදා ගැනෙන ක්‍රමවේද යනාදී අදාළ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් විවෘත ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මානව ගරුත්වය, සමානත්වය හා නිදහසද පදනම් කොට ගත යුතුය.

නැතහොත් ඊට විකල්ප වශයෙන්,

(11) එම තහංචි සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 19(3) වගන්තිය යටතේ එන විශේෂතාවලට පමණක් සීමා විය යුතුය.

(අ) අන්‍යයන්ගේ අයිතිවාසිකම්වල හා කීර්තියේ ගෞරවය සඳහා සහ
(ආ) ජාතික ආරක්ෂාවත් මහජන විනය හෝ මහජන සෞඛ්‍යය හෝ සදාචාරයේ සුරක්ෂිතතාවත් සඳහා විය යුතුය.

**1.3 පාර්ලිමේන්තු වරප්‍රසාද** . පාර්ලිමේන්තු වරප්‍රසාද සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි පැනැවී තිබෙන තහංචිවලින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනට අනවශ්‍ය වරප්‍රසාද පිරිනැමෙන නිසාත් කතා කිරීමේ ප්‍රකාශනයේ හා තොරතුරු ලබා ගැනීමේ නිදහස පිළිබඳ අයිතියට අදාළ නවීන ප්‍රමිතිවල එය පිළිබිඹු නොවන නිසාත් එම තහංචි ඉවත් කළ යුතුය. 1953 පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද පනත එහි මුල්

තත්ත්වයට ආපසු හැරවිය යුතු අතර ඊට ආනුෂංගිකව සිදු කැරුණු සංශෝධනද විශේෂයෙන්ම බැහැර කළ යුතුය.

## 1.4 හදිසි නීති ක්‍රියාත්මක වන අවස්ථාවලදී මූලික අයිතිවාසිකම් හීනවීම

හදිසි නීති ක්‍රියාත්මක වන අවස්ථාවලදී මූලික අයිතිවාසිකම් මත පැනැවෙන තහංචිය, අවශ්‍ය තැන්වලදී ශ්‍රී ලංකාවේ තත්ත්වයට ගැළපෙන සේ නවීකරණය කැරුණු "සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ " 4 වැනි වගන්තියෙන් ඉඩ සැලැසෙන පරිදි සහනය ඉල්ලා අධිකරණය ඉදිරියට යෑමට පුරවැසියනට ඇති අයිතියට පමණක් සීමාවිය යුතුය. ඒ මෙසේය.

(1) එම තහංචි පැනවිය යුත්තේ නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද හදිසි තත්ත්වයක් පවත්නා අවස්ථාවකදී එය ජාතික ජීවයට තර්ජනයක් වන්නේ නම් පමණකි.

(2) එම තහංචි ජාත්‍යන්තර නීතිය යටත් ඊට අදාළ අනෙක් බැඳීම්වලට අනනුකූල නොවන්නේ නම් පවත්නා තත්ත්වයේ හදිසි අවශ්‍යතාවට සරිලන දුරකට පමණක් සීමා කළ හැක්කේය.

(3) එම තහංචි නිසා හුදෙක් කෙනකුගේ වර්ගය, කුලය, වර්ණය, ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂ පළපුරුදුකම්, භාෂාව, ආගම හෝ සමාජ පසුබිම අනුව කිසිවකුට වෙනස්කම් සිදු නොවිය යුත්තේය.

(4) ඇතැම් විශේෂිත අයිතිවාසිකම්, එනම් ජීවිතයට ඇති අයිතිය, වධ හිංසා/කෲරත්වය, අමානුෂික අවමානාත්මක සැලකිලි හෝ දඬුවම් යනාදියෙන් නිදහස්ව සිටීමේ අයිතිය වාල්භාවයෙන් නිදහස්ව සිටීමේ අයිතිය, ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට නොහැකි වීමේ එකම හේතුව මත බන්ධනාගාරගත කරනු ලැබීමෙන් නිදහස්ව සිටීමේ අයිතිය යනාදී හිමිකම්, එම තහංචි මඟින් කිසිදු හේතුවක් නිසාවත් හීන නොවිය යුත්තේය.

## 1.5 නීතිකරණය පිළිබඳ ව්‍යවස්ථානුරූපිතාව සම්බන්ධ අධිකරණ සමාලෝචනය

නීතිකරණයත් පවත්නා නීති මෙන්ම අනාගතයේදී පැනැවෙන නීතිත් ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවට අනුකූලද යන්න පදනම් කොටගෙන ඕනෑම අවස්ථාවක අධිකරණ සමාලෝචනයට භාජන කිරීමේ ඉඩකඩ සැලැසෙන සේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු අතර පැනැවුණු නීති පිළිබඳ අධිකරණ සමාලෝචනය සඳහා කාලසීමාවක් නොතිබිය යුත්තේය. ඒ සඳහා ඉඩ සැලැසෙනු පිණිස ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 16(1) සංශෝධනය කළ යුතුය.

"පවත්නා සියලුම ලියැවුණු හා නොලියැවුණු නීති මේ පරිච්ඡේදයේ අදාළ විධිවිධානවලට යම් ආකාරයකින් අනනුකූල"වන්නේ වී නමුත් වලංගු විය යුතුය. ක්‍රියාත්මක විය යුතුය" යනුවෙන් දැක්වෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16(1) වගන්තියෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියේ මූලික ප්‍රතිපත්තියක් උල්ලංඝනය වන හෙයින් එය ඉවත් කළ යුතුය.

## 2. පුවත්පත් හා පුවත්පත් නීති

2.1 නිල රහස් යන යන්න අනුමාන වශයෙන් හා පුළුල්ව විස්තර කරන **නිල රහස් පනත** ඉවත් කළ යුතු අතර, තොරතුරු අනාවරණය කිරීමේ නියමයක්ද රහස්‍යතාව ව්‍යතිරේකයක්ද බවට පත් කරන **තොරතුරු ලබා ගැනීමේ අයිතිය** පිළිබඳ පනතක් පැනැවිය යුතුය.

2.2 **තොරතුරු ලබා ගැනීමේ අයිතිය පිළිබඳ පනතකින්** විවෘත භාවය හා විවෘත රජයක මූලධර්ම පිළිබිඹු විය යුතුය. අනාවරණය නොකළ හැකි තොරතුරු වර්ග, ඒවායේ රහස්‍යතාව පවත්නා කාල සීමාවද දක්වමින් මෙවැනි නීතියක් මඟින් ලැයිස්තුගත කළ යුතුය. ප්‍රවේශය සඳහා බලය දෙන නෛතික විධිවිධාන, ස්වාධීන මණ්ඩලයකට අභියාචනා කිරීමේ විධිවිධානද සමග පැනැවිය යුතුය. පෞද්ගලික රහස්‍යතාව ආරක්ෂා කළ යුතු වෛද්‍ය වාර්තාද ඇතුළු වෙළෙඳ රහස්, රහසිගත වාණිජ තොරතුරු, නීතිය ක්‍රියාත්මක කරනු පිණිස පැවැත්වෙන පරීක්ෂණ විශ්වාසනීයත්වය මත ලබා ගන්නා ලද තොරතුරු හා ජාතික ආරක්ෂාව යන ශ්‍රේණි නිදහස් කිරීමේ විධිවිධාන එවැනි නීතියක් මඟින් පැනවිය යුතුය. 2004 දී ඇමැති මණ්ඩලය අනුමත කළ "තොරතුරු නිදහස පිළිබඳ පනත" අනුව යන "තොරතුරු ලබා ගැනීමේ අයිතිය" පිළිබඳ පනත් කෙටුම්පතක් සම්මත කරන මෙන් අපි රජයෙන් ඉල්ලා සිටිමු.

හිතුවක්කාරීව තොරතුරු ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ පැමිණිලි පරීක්ෂා කිරීමේ බලතල සහිත ස්වාධීන අධිකාරියක් පත් කිරීමට විධිවිධාන සැලැස්විය යුතුය. අනෙක් නීතිවල රහස්‍යතා විධිවිධාන, තොරතුරු ලබා ගැනීමේ අයිතිය පිළිබඳ නීතියට වඩා පහළ තැනක තිබිය යුතුය.

**2.3 1973 පුවත්පත් මණ්ඩල නීතිය** . ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මගින් දැනට ස්වයං නියාමන ප්‍රතිපත්තියක් බල පවත්නා හෙයින් 1973 පුවත්පත් මණ්ඩල නීතිය ඉවත් කළ යුතුය.

2.4 එහි 16 වැනි වගන්තියෙන්, ඇමැති මණ්ඩල රැස්වීම් වාර්තා කිරීමත් ඇමැති මණ්ඩල තීරණ හා ලියවිලි පළ කිරීමත් පුවත්පත්වලට තහනම් වන හෙයින් හිතුවක්කාරී, බාධාකාරී හා අයුක්ති සහගත එම වගන්තිය ඉවත් කළ යුතුය.

## 2.5 ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති සමාගමේ අයිතිය පුළුල් කිරීම

ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම(විශේෂ විධිවිධාන) නීතියෙන් සමස්ත වශයෙන් ඒකාර්ථයෙන්ම ප්‍රකශ වුණේ ආයතනයේ අයිතිය පුළුල් කිරීමේ ප්‍රතිපත්තිය විනා ජනසතු කිරීමක් නොවේ. එකකට පසුව එකක් වශයෙන් බලයට පත් ශ්‍රී ලංකා ආණ්ඩු නීතියේ අභිප්‍රාය අනුව ලේක්හවුස් ආයතනයේ අයිතිය පුළුල් කරන බවට මැතිවරණ ප්‍රකාශන මඟින් පොරොන්දු වන අතර 1996 රජය විසින් පත් කරන ලද කමිටුවක් සමාගමෙ අයිතිය පුළුල් කිරීම සඳහා යොදා ගතයුතු ක්‍රියාදාමයක්ද යෝජනා කෙළේය. එහෙත් ඒ නිර්දේශ ක්‍රියාත්මක වී නැත්තේය. ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම් නීතිය වහාම ක්‍රියාත්මක කිරීම අවශ්‍යය.

## 3. දණ්ඩ නීති සංග්‍රහය යටතේ වැරැදි

19 වැනි සියවසේදී සම්පාදනය කරන ලද 120 වැනි වගන්තිය පමණට වැඩි පරාසයකින් යුක්ත හෙයින් එය එක්කෝ ඉවත් කළ යුතුය. නැතහොත් මානව අයිතිය පිළිබඳ ජාත්‍යන්තර නීති සමඟ සැසඳෙන සේ නවීකරණය කළ යුතුය.

## 4 අධිකරණයට අපහාස කිරීම

1981 එක්සත් රාජධානියේ අධිකරණ අපහාස පනතත් 1971 ඉන්දියාවේ අධිකරණ අපහාස පනතත් අනුව පුළුල් ව්‍යුහයකින් සම්පාදනය වුණු අධිකරණ අපහාස නීතියට හා විනිශ්චයාභිමුඛ රීතියට අයත් පරාසය නියත වශයෙන් පැහැදිලි කරනු පිණිස ස්ථාවර හා පටිපාටිගත "අධිකරණ අපහාස පනතක්" තිබිය යුතුය. අධිකරණ තීන්දු අධිකරණයේ චර්යාව හා අධිකරණ පටිපාටිකරය,සහේතුකව හා සාධාරණව විවේචනය කිරීමටත් නඩු විභාග දිගු කලක් අධිකරණය හමුවෙහි පවත්නා අවස්ථාවක අධිකරණ පරිපාලනයට නියත අගතියක් සිදු නොවන පරිදි එසේ කිරීමටත් එම නීතියෙන් ඉඩ ලැබිය යුතුය. මූලාශ්‍රවල රහස්‍යතාව පිළිබඳ පොදු රීතිවල, වෙනත් දේ අතර, ව්‍යතිරේක ඉතා පටු අන්දමින් පැහැදිලි කැරෙන අවස්ථාවලදී එය මේ නීතියෙන් පුළුල් විග්‍රහයකට ලක්විය යුතුය. අපහාස චෝදනා තහවුරු කිරීම සඳහා සාධාරණ කාර්ය පටිපාටි මේ නීතියෙන් නියම විය යුතුය. අපහාසයක් සිදු වී ඇතැයි තහවුරු වූ විට පැවැරිය යුතු උපරිම දඬුවම මේ නීතියෙන් නියම විය යුතුය.

## 5. ප්‍රකාශන තහනම් කිරීම

ව්‍යවස්ථානුකූලව ලද හැකි අවසරයත් ප්‍රකාශනයේ හා තොරතුරු ලබා ගැනීමේ නිදහසට අනුකූලවත් හැර ඉන් බැහැරව සිදුවන අතපෙවීම් වළක්වනු පිණිස ප්‍රකාශන තහනමත් ප්‍රකාශන ආනයනය මත පැනැවෙන රේගු තහනමත් පිළිබඳ නීතියේ වර්තමාන තත්ත්වය පැහැදිලි කළ යුතුය.

## 6. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 6 වැනි සංශෝධනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වැනි සංශෝධනයේ විධිවිධාන කතා කිරීමේ හා ප්‍රකාශනයේ නිදහස සමඟ ගැටෙන්නේද යන කාරණය මත එම විධිවිධාන ප්‍රතිශෝධනයට භාජන විය යුතුය.

## 7. හදිසි නීතිය

### 7.1 හදිසි නීතිය යටතේ වාරණ හා වෙනත් තහංචි

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියෙන් ප්‍රකාශිත නියමාවළිය අනුව හැර ඉන් බැහැරව ප්‍රකාශන පූර්ව තහනමකට ලක් නොවිය යුතු අතර ප්‍රකාශනය තහනම් කරන එවැනි රෙගුලාසි ගැසට් පත්‍රයෙන් ප්‍රකාශනයට පත්විය යුත්තේය. එමෙන්ම මාධ්‍යයේ සියලු අංශ ඔස්සේ භාෂා තුනෙන්ම වහාම ප්‍රචාරය විය යුත්තේය.

එපමණක්ද නොව, නියමිත කාල සීමාවක් තුළ පාර්ලිමේන්තුවේ පුළුල් විවාදයකට භාජන වී අනුමත විය යුත්තේය.

7.1.2. වාරණයට අදාළ ප්‍රතිපත්තිය ජාතික ආරක්ෂාව, ප්‍රකාශන නිදහස හා තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ බලය පිළිබඳ 1995 ඔක්තෝබර 1 වැනිදා "ජොහැන්නස්බර්ග් මූලධර්මවල" මාර්ගෝපදේශවලට අනුකූල විය යුත්තේය.

7.1.3(1947) මහජන ආරක්ෂක නියෝග යටතේ පැනැවෙන සියලු රෙගුලාසි ව්‍යවස්ථානුකූලව නියමිත අවශ්‍යතාව හා/හෝ යෝග්‍යතාව හා/හෝ ප්‍රමාණානුකූලතාවද පිළිබඳ නියමාවළියට යටත් විය යුත්තේය. හදිසි නීතිය යටතේ පුද්ගලයකු අත්අඩංගුවට ගත යුත්තේ නීතියෙන් සාධාරණීකරණය වන යුක්ති සහගත පදනම මත විනා අනුමානය හෝ සාමාන්‍ය සැකය මත නොවේ. අත්අඩංගුවට ගැනුණු පුද්ගලයා වහාම ළඟම තිබෙන උසාවියට ඉදිරිපත් කළ යුත්තේය.

7.1.4 ප්‍රකාශන තහනම් කරන හදිසි නීති රෙගුලාසි, (1979) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදක් සේ සැලැකෙන කවරම සිද්ධියක් හෝ සම්බන්ධ ඕනෑම ප්‍රකාශනයක් නිසි බලධාරියකුගේ අවසරය නැතිවම තහනම් කරන්නා වූද එකී පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පුවත්පත් මුද්‍රණාල මුද්‍රා තැබීමට බලය දෙන්නා වූද එකී පනතේ විධිවිධාන සමඟම එක්කෝ ඉවත් කළ යුතුය. නැතහොත් අවශ්‍යතාව හා/හෝ යෝග්‍යතාව හා/හෝ ප්‍රමාණකූලතාවට ගැළපෙනු පිණිස

අමාත්‍ය මට්ටමේ බලතලවලට යටත් වන ලෙසත් මුද්‍රණාල මුද්‍රා තැබීමේ දැඩි ක්‍රියාවලියට වඩා ප්‍රමාණවත් දඬුවම් පැහැදිලිව දැක්වෙන ලෙසත් සංශෝධනය කළ යුතුය.

## 8. මුද්‍රණ කඩදාසිවල අධික මිල

මුද්‍රණ කඩදාසි වෙනුවෙන් දැන් අය කැරෙන අත්‍යධික බද්ද නිසා පුවත්පත් මඟින් අධ්‍යාපනය හා තොරතුරු ලබා ගැනීමේදී ආර්ථික දුෂ්කරතා ඇති අයට අධික වියදමක් දරන්නට සිදු වී තිබේ. ආනයන බද්ද, දැනුම වඩා හොඳින් බෙදා හැරීමටත් ව්‍යාප්ත කිරීමටත් ප්‍රබල බාධකයක් වී තිබේ. ආනයන සඳහා ඉතාම අඩු බද්දක් අය කරන මෙන් යෝජනා කරමු.

වාරණය හා බාධාකාරී මාධ්‍ය නීති යනාදී සෘජු ක්‍රියාමාර්ග මඟින් පමණක් නොව මුද්‍රණ කඩදාසි වියදම හා ආනයන බදු යනාදී වශයෙන් යටිතලයේ කටයුතු මඟින්ද භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස හීන විය හැකි බව ඒත්තු ගැනීම වැදගත්ය. මුද්‍රණ කඩදාසි මත පැනැවෙන අත්‍යධික ආනයන බද්ද හේතු කොටගෙන පුවත්පත් පවත්වා ගෙන යාහැකි නොවන තත්ත්වයක් උද්ගත වන බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය විය හැකි බවත් තීන්දු කළ ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය යථෝක්ත මූලධර්මය පිළිගත්තේය.

බටහිර රටවල පුවත්පතක් නිෂ්පාදනය සඳහා යන මුළු වියදමෙන් මුද්‍රණ කඩදාසි සඳහා වැය වන්නේ සියයට 25.30 අතර මුදලකි. ඒ සමග සසඳන විට ශ්‍රී ලංකාවෙහි පුවත්පතක් නිපදවනු පිණිස වැය කළ යුතු මුළු වියදමෙන් මුද්‍රණ කඩදාසි සඳහා වැයවන ප්‍රමාණය සියයට 50.60 අතර ගණනකි.

සමස්ත ලෝකයේම මුද්‍රණ කඩදාසි අවශ්‍යතාවෙන් සියයට 70 ක් නිෂ්පාදනය කරන සමාගම් තුනක් මේ නිෂ්පාදනය දැන් තරයේ පාලනය කරන අතර කඩදාසි මිල නිගමනය වන්නේ ඉල්ලුම හා සැපයුම මත නොවේ.

මුද්‍රණ කඩදාසි මිල ඉහළ යෑමේ සෘජු ප්‍රතිඵලයක් වශයෙන් පුවත්පත්වල වියදමට සරිලන සේ මිල වැඩි නොකර සිටින්නට ප්‍රකාශකයනට නොහැකි වන අතර එය ප්‍රවෘත්ති හා අදහස් ප්‍රචාරණය කෙරෙහි බලපාන්නේය.

කුඩා රටවල පුවත්පත් ප්‍රකාශකයන් මුහුණ පා සිටින මේ ගැටලු හීන වේගෙන යන පාඨක ජනතාව ආරක්ෂා කරනු පිණිස සැලැකිල්ලට ගන්නා මෙන් මුද්‍රණ කඩදාසි නිෂ්පාදනයෙහි නියුක්ත ප්‍රමුඛයන්ගෙන් මේ ප්‍රකාශනය මඟින් ඉල්ලා සිටිනු ලැබේ.

## 9. පොදුජන විකාශන සේවය

9.1 රාජ්‍ය අරමුදලෙන් හා රාජ්‍ය කළමනාකරණයෙන් ශ්‍රී ලංකාවෙහි පැවැත්වෙන සියලුම විකාශන සේවා පොදු ජන සන්තක මණ්ඩල බවට පරිවර්තනය විය යුතු අතර ඒවා කිසිදු ආකාරයක රාජ්‍ය පාලනයට යටත් විය යුතු නොවේ.

9.2 විකාශන අධිකාරියේ පාලන මණ්ඩල සමතුලිත හා ස්වාධින සංයෝජනයක් වශයෙන් තහවුරු කිරීමෙන් පොදුජන විකාශනයේ අගය ආරක්ෂා කළ යුතුය.

## 10 විද්‍යුත් මාධ්‍ය

### 10.1 ස්වාධීන විකාශන අධිකාරියක්

විකාශන ප්‍රතිපත්තියේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණයෙහි යෙදෙනු පිණිස, කිසිදු ආකාරයක රාජ්‍ය හෝ රාජ්‍ය නොවන බලපෑමකින් තොර අව්‍යාජවම ස්වාධීන විකාශන අධිකාරියක් තිබිය යුත්තේය. ප්‍රජා ගුවන් විදුලි සේවය, තාක්ෂණ අංශද ඇතුළු පොදු හා පෞද්ගලික විකාශන සේවා සඳහා බලපත් දීම සම්බන්ධයෙන් ඒ අධිකාරිය වගකිව යුත්තේය. පොදුජන සුබසිද්ධියට අදළ තොරතුරු හා අදහස් ලබා ගැනීමට ජනතාවට ඇති අයිතිය මෙන්ම විකල්ප මත පිළිබඳ සාධාරණ සමතුලනය පවත්වා ගැනීමේ මූලධර්මද නීතියෙන් නිශ්චිතව ප්‍රකාශ විය යුත්තේය. මෙම අධිකාරී මණ්ඩලයට සාමාජිකයන් තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය කිසිදු දේශපාලන කණ්ඩායමක ආධිපත්‍යයට අවනත නොවන බව තහවුරු විය යුත්තේය.

### 10.2 ප්‍රජා ගුවන් විදුලි හා රූපවාහි සේවා

ප්‍රජා ගුවන්විදුලි හා රූපවාහිනි සේවයක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති මාලාවක් නීතියෙන් සම්පාදනය විය යුත්තේය. වැඩසටහන්වලින් අවම වශයෙන් සියයට 50 ක් ප්‍රජා සේවය සම්බන්ධයෙන් ප්‍රකාශිත අරමුණුවලට සීමා වන බවට නියාමන අධිකාරියක් වග බලා ගත යුත්තේය.

### 10.3 අන්තර්ජාලය

ගතවූ දස වසර තුළ ඇතිවුණු සංවර්ධන ක්‍රියාවලී අතර සුවිශේෂී තැනක් ගෙන ඇත්තේ අන්තර්ජාලයේ ව්‍යාප්තියයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මාධ්‍ය ප්‍රජාතන්ත්‍රීකරණය වී ඇති අතරම බ්ලොග් වෙබ් අඩවි පවත්වා ගෙන යන්නන්ගේ ගණයේ වෘත්තිය නොවන මාධ්‍යකරුවෝද දිරිගැන්වී

සිටිති. නිදහස් භාෂණයත් ප්‍රජාතන්ත්‍රවාදී මාධ්‍යයත් වෙනුවෙන් බ්ලොග් වෙබ් අඩවිකරුවන් ගෙන් පිරිනැමෙන දායකත්වය අපි පිළිගන්නෙමු. එමෙන්ම එම වෙබ් අඩවිකරුවන් රාජ්‍ය පාලනයට පහසුවෙන් අවනත වන්නන් බවත් ඔවුන් ඔවුන්ගේ කටයුතු සාම්ප්‍රදායික මුද්‍රණයත් මාධ්‍ය විකාශනයත් වශයෙන් අයථා ලෙස පරිහරණය කරන බවත් අපි දැනගෙන සිටිමු. වගකීමක් ඇති බ්ලොග් වෙබ් අඩවිකරුවන්ටත් අනෙකුත් අලුත් මාධ්‍ය ක්‍රියාකරුවන්ටත් අපගේ සහයෝගය දැක්වීමට අප මේ අවස්ථාව උපයෝගි කර ගන්නා අතරම ශක්තිමත් හා ස්වාධීන ඒකරාශී මාධ්‍යයක් ස්ථාපනය කිරීමේ අරමුණ ඇතිව ඔවුන් හා ඒකාබද්ධව කටයුතු කිරීමටද අපි බලාපොරොත්තු වෙමු.

10.4 අන්තර්ජාලය සංවාදාත්මක ප්‍රජාතන්ත්‍රය සඳහා ඉතා වැදගත් විද්‍යුත් මාධ්‍ය අඩවියක් සේ සලකන ලෙසත් නිදහස් භාෂණය සඳහා අන්තර්ජාලය තුළද ඉඩකඩ පුළුල් කරන අන්දමේ ප්‍රතිපත්ති ඒ වෙතද ව්‍යාප්ත කරන ලෙස මෙන්ම සාධාරණ පදනම් නොමැතිව වෙබ් අඩවි තහනම් කිරීමේත් ඊට බාධා පැමිණවීමේ හා එය වාරණයට ලක්කිරීමේ සියලු ප්‍රතිපත්තිවලින් වළකින ලෙසත් අපි රජයෙන් විශේෂයෙන් ඉල්ලා සිටිමු. අන්තර්ජාලගත පුවත්පත් කීපයක්ද සමඟ දැන් සාම්ප්‍රදායික මුද්‍රිත මාධ්‍යයත් අන්තර් ජාලයත් අත ඒකාරම්මණයක් පවත්නා හෙයින් මේ ප්‍රකාශනයෙන් අපේක්ෂිත සියලු වරප්‍රසාද හා ආරක්ෂාව පුවත්පත් වෙබ් මුද්‍රණ වෙතද ව්‍යාප්ත කරන මෙන් අපි තරයේ ඉල්ලා සිටිමු.

## 11. මූලාශ්‍රවල අරක්ෂාව

මාධ්‍ය මූලාශ්‍රවල රහස්‍යතාව සුරකිනු පිණිස නීති පැනැවිය යුතු අතර එම නීති, මූලාශ්‍ර අනාවරණය සඳහා බල කැරෙන කොන්දේසි පැහැදිලිව දැක්වෙන අධිකරණ අපහාස නීතියේද කොටසක් විය යුතුය.

## 12. නීති සමාලෝචනය

නීති සමාලෝචනයට භාජන විය යුතුවාක් මෙන්ම එය ජාත්‍යන්තරව පිළිගැනුණු සමකාලීන නියමාවළී සමඟ සැසැඳෙන සේ සංශෝධනය විය යුතුය. විශේෂයෙන්ම 1927 “නොසරුප් ප්‍රකාශන නීති” 1912 “ ප්‍රසිද්ධ රැඟුම් පාලන නියෝග” “ප්‍රසිද්ධ රැඟුම් පාලන මණ්ඩල පනත” 1958 “ආගම් අපහාස ප්‍රකාශන පනත” සමාලෝචනය විය යුතුය.

## 13. මාධ්‍ය ආයතනවල හා මාධ්‍යවේදීන්ගේ වගකීම්.ස්වේච්ඡානුකූල ආචාර ධර්ම පද්ධතිය.ස්වයං නියාමනය සඳහා සභාය

13.1 ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලය, ශ්‍රී ලංකා පුවත්පත් සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා වෘත්තිය පත්‍ර කලාවේදීන්ගේ සංගමය, ශ්‍රී ලංකා දෙමළ මාධ්‍ය සන්ධානය, ශ්‍රී ලංකා මුස්ලිම් සංසදය, මාධ්‍ය සේවක වෘත්තීය සංගම් සංවිධානය සහ දකුණු ආසියා නිදහස් මාධ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් අනුමත කරනු ලැබ දැනට වලංගුව පවත්නා, ශ්‍රී ලංකා කර්තෘ සංසද වෘත්තීය ආචාරධර්ම පද්ධතියෙන් මුද්‍රිත මාධ්‍යයේ සියලු ආයතන/මාධ්‍යකරුවෝ බැඳී සිටිය යුත්තෝය. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සමග අප්‍රමාදී සහයෝගයෙන් කටයුතු කළ යුත්තෝය. කොමිසමේ ලේකම් කාර්යාලයේ නිවේදනවලින් හා කොමිසමේ අරගල නිවාරණ මණ්ඩලයේ තීන්දුවලින් බැඳී සිටිය යුත්තෝය. (ඉහත සඳහන් කර්තෘ සංසද ආචාර ධර්ම මාලාව මේ ප්‍රකාශනයේ අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් අමුණා තිබේ).

13.2 මාධ්‍යයක් නිදහස් විය යුත්තේ හුදෙක් දේශපාලන බලපෑම්වලින් පමණක්ම නොවේයැයිද අයෝග්‍ය වාණිජ බල පෑම්වලින් හා පාලනයෙන්ද නිදහස්ව සිටීමේ වෑයමක් මාධ්‍යය දැරිය යුතුයැයිද අපි ඒත්තු ගෙන සිටිමු. මාධ්‍යය වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් මතැ යැපෙන බව අප පිළිගන්නා අතරම ඇතැම් වෙළෙඳ ආයතන ප්‍රචාරක දැන්වීම් නොදී සිටීම මඟින් මාධ්‍ය වෙත බලපෑම් එල්ල කිරීමේත් කතුවැකි ඉඩකඩ පවා ග්‍රහණය කර ගැනීම සඳහා ප්‍රයත්න දැරීමේත් ප්‍රවණතාවක් ලෝකයෙහි පවත්නා බවත් අපි විශ්වාස කරමු. එවැනි අයෝග්‍ය වාණිජ බලපෑම්වලින් නිදහස්ව මාධ්‍යය පවත්වා ගෙන යෑමට අපි වෑයම් කරන්නෙමු. වෙළෙඳ ප්‍රචාරක දැන්වීම්වල වාසියෙන් අපගේ කර්තෘ මාණ්ඩලික හා ප්‍රවෘත්ති ප්‍රතිපත්තියටත් බලපෑම් එල්ල නොවන බවට මෙන්ම අපගේ අවංක භාවය හා වාර්තාකරණයේ අරමුණ උල්ලංඝනය නොවන බවටත් අපි වගබලා ගන්නෙමු.

13.3 උසස් ප්‍රමිති අත්පත් කර ගැනීම සඳහා නිර්මාණාත්මක විවේචනයෙහි යෙදෙනු පිණිස ප්‍රතිපෝෂණ සැපැයීමෙන් හා සමානයන්ගේ විචාරයෙන් අපට උදවු කරන ලෙසත් ශ්‍රී ලංකාවෙහි නිදහස් හා ස්වාධීන මාධ්‍යයක් නිර්මාණ කරනු පිණිස අප සමඟ හවුල්ව කටයුතු කරන ලෙසත් ප්‍රඥා ප්‍රජාවගෙන් වෘත්තීය මණ්ඩලවලින් වෙනත් ක්‍රියාකාරීන්ගෙන් වියතුන්ගෙන් හා සාමාන්‍ය පුරවැසියන්ගෙන්ද අපි ඉල්ලා සිටිමු.

## 14. පුවත්පත් කලාවේදීන්ගේ කාර්ය වර්ධනය හා ආරක්ෂාකාරී තත්ත්වය

නිදහසේ ස්වකීය වෘත්තියෙහි නියුක්ත විය හැකි පුවත්පත් කලාවේදීන් නොමැතිව නිදහස් මාධ්‍යයක් තිබිය හැකි නොවේ. නිදහසේ කටයුතු කිරීමේ ශක්තිය වෘත්තීය පුවත්පත් කලාවේදීනට තහවුරු කර දීමේ වැදගත්කම අවබෝධ කරගෙන සිටින අපි පුවත්පත් කලාවේදීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා

කරන නීති පැනවීමේත් පහත දැක්වෙන ප්‍රතිපත්තිද ක්‍රියාත්මක කිරීමේත් අවශ්‍යතාව ඒත්තු ගෙන සිටිමු.

(අ) ඉන්දියාවේ රැකියා තත්ත්ව විධිමත් කරනු පිණිස උපයෝගී කොට ගැනෙන "1955 වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ හා අනෙක් පුවත්පත් සේවකයන්ගේ (සේවා කොන්දේසි)" පිළිබඳ පනත අනුව නීතියක් පනවන සේ ඉල්ලීම

(ආ) සන්නද්ධ ගැටුම් පවත්නා ප්‍රදේශවල අනතුරුදායක ගෙල වෘත්තියෙහි යෙදෙන පුවත්පත් කලාවේදීන්ගේ ආරක්ෂාව සලසන "තුන්වැනි ජිනීවා ප්‍රඥප්තියේ" අතිරේක පිටපතේ (1977 ජුනි 8) 79 වැනි වගන්තිය ක්‍රියාත්මක කිරීම.

(ඉ) පුවත්පත් කලාවේදීන් සඳහා රක්ෂණ ව්‍යාපෘති පිහිටුවන සේ ඉල්ලා සිටීම.

(ඊ) පුවත්පත් කලාවේදීන්ගේ සුබ සිද්ධිය සුරකිනු පිණිස සාමූහික සංවිධාන පිහිටුවන සේ ඉල්ලීම

## 15. පුවත්පත් කලා පුහුණුවේ අවශ්‍යතාව

මාධ්‍යයට වඩාත් පුළුල් වෘත්තීය තත්ත්වයක් ආරෝපණය කිරීමේ අවශ්‍යතාවත් විශේෂයෙන්ම, තරුණ පුවත්පත් කලාවේදීන් ශාස්ත්‍රීය හා ප්‍රායෝගික අංශ දෙකෙන්ම පුහුණු කිරීමත් දැනටම සේවයෙහි නියුක්ත පුවත්පත් කලාවේදීනට ඒ පුහුණුව දීමත් සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවත් මේ ප්‍රකාශනයෙන් අවධාරණය කැරෙයි. ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලයෙන් දැන් පුවත්පත්කලාවේදී ඩිප්ලෝමාවක් පිරිනමන පාඨමාලාව උපාධියක් පිරිනමන පාඨමාලාවක් බවට පත් කිරීමද ඊට ඇතුළත් වෙයි

**මෙහි අන්තර්ගත විධිවිධාන ඉක්මවා යමින් ප්‍රතිශෝධනය සඳහා උද්ඝෝෂණය කිරීමට පෞද්ගලික සංවිධානවලට ඇති අයිතියට මේ ඒකමතික ප්‍රකාශනයෙන් වාරණයක් නොපැනැවෙයි.**

## සමාප්තිය

මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ දස වැනි සංවත්සරය නිමිති කොටගත් මෙම උත්සවය, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් , ශ්‍රී ලංකා වෘත්තිය පත්‍ර කලාවේදීන්ගේ සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා කර්තෘ සංසදය සහ ශ්‍රී ලංකා පුවත්පත් සමාජය යන සංවිධානවල සහභාගීත්වය හා එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සාංස්කෘතික සංවිධානයේ ආධාරද ඇතිව

සංවිධානය කැරුණු බවත් ඒ මඟින් මාධ්‍ය ක්ෂේත්‍රයේ විවිධ අංශවල සහභාගීත්වයේ උපරිම ජීවය ප්‍රදර්ශනය කැරුණු බවත් අපි කෘතඥතා පූර්වකව සඳහන් කරමු.

පොදු වශයෙන් ප්‍රකාශනයේ නිදහසක් විශේෂයෙන් මාධ්‍ය නිදහස හා ඊට අනුබද්ධ සමාජ වගකීමක් ප්‍රවර්ධනය කරනු පිණිස අප දරන ප්‍රයත්නයේදී අපගේ වැඩිදුර සහයෝගයත් එක්සත් භාවයත් වෙනුවෙන් අප කැප වන බව යළි යළිත් ප්‍රකාශ කරමු. එහෙයින් අපගේ පොදු දර්ශනය යථාර්ථයක් බවට පත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක වනු පිණිස අපගේ මතවල විවිධත්වය හා අපගේ ක්‍රියා කලාපයේ වෙනස්කම් යටපත් කර ගන්නා මෙන් අපි සියලු මාධ්‍ය සංවිධානවලින් ඉල්ලා සිටිමු.

- **ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමය**
- **නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**
- **ශ්‍රී ලංකා පුවත්පත් ප්‍රකාශකයන්ගේ සංගමය**
- **ශ්‍රී ලංකා කර්තෘ සංසදය**